**Becoming a Community Disability Advocate (ආබාධිත ප්‍රජාව සඳහා නියෝජිතයෙකු වීම)**

TOTAL DURATION: 00:16:22

| Time in | Time out | Transcription | Translation |
|---|---|---|---|
| 00:00:15 | 00:01:53 | Charitha: ආයුබෝවන්! ආබාධිත නමුත් සතුටින් දිවි ගෙවන විවිධ සංස්කෘතීන්ට අයත් පුද්ගලයන් පිළිබඳව කතා කරන, Speak My Language වැඩසටහනට ඔබව පිළිගන්නවා. මම Ethnic Communities Council of Victoria ආයතනයේ චරිත දිසානායක. අපගේ සාකච්ඡාවලදී විවිධ සංස්කෘතීන්ට අයත් ආබාධිත පුද්ගලයන් ඔවුන් කොතනක දිවි ගෙව්වත් සතුටින් ජීවත්වීමට තමන්ගේ හැකියාවන් සහ ප් රජාවේ ඇති සම්පත් යොදා යොදාගන්නා ආකාරය සාකච්ඡා කරනවා. ඒවාට සත්‍ය තොරතුරු, ආබාධිත පුද්ගලයන්ගේ අදහස් සහ ඉඟි ආබාධිත පුද්ගලයන්ට ඇති අවස්ථා ක්‍රියාකාරකම් සහ ඇතුළු විය හැකි ස්ථාන පිළිබඳව තොරතුරු ඇතුලත්. අද අපේ ආරාධිතයා ප්‍රදීප් හේවාවිතාරන. ප් රදීප් රෝද පුටුවක ආධාරයෙන් කටයුතු කරන ආබාධ සහිත අයෙක්. නමුත් ඔහු පසු ගිය කවුන්සිල් මැතිවරණයට ඉදිරිපත් උනා. ඔහුගේ සීමාවන් පසෙකලා තමයි ඔහු ඒ මැතිවරණයට ඉදිරිපත් උනේ. ඔහුගේ අරමුණ උනේ ආබාධිත පුද්ගලයන් වෙනුවෙන් හඬක් නැඟීමයි. ආබාධ සහිත පුද්ගලයන්ට ඔබ ආදශර්මත් චරිතයක්. පසුගිය කාලයේ ජීවිතයේ ඔබ ලැබූ ජයග්‍රහණ ආබාධිතයෙක් ලෙස සිටිමින්ම ඔබ සාමාන්‍ය ජීවිතයේ ලැබූ ජයග් රහණ ගැන පිළිබඳව අපට සඳහන් කරන්න පුළුවන්ද? | Charitha: Welcome! Welcome to Speak My Language, a program that talks about people from different cultures who are disabled but living happily. I am Charitha Dissanayake from the Ethnic Communities Council of Victoria. In our discussions, we discuss how disabled people from different cultures use their abilities and community resources to live happily wherever they live. They include factual information, opinions and tips from people with disabilities about activities and accessibility opportunities for people with disabilities. Today our guest is Pradeep Hewavitharana. Pradeep is a disabled person who works with the help of a wheelchair. He contested the last council election. He stood aside his limitations and ran for that election. His aim was to raise a voice for disabled people. You are a role model for people with disabilities. Can you tell us about your recent achievements in life while being disabled? |
| 00:01:55 | 00:04:48 | Pradeep: මම දැනට අවුරුදු | Pradeep: I have been disabled in |

| | | | |
|---|---|---|---|
| | | 20 කට වඩා ආබාධිතව වීල් චෙයාර් එකක ඉන්නේ. මම දැනට අවුරුදු 14 ක් පමණ වික්ටෝරියා තුළ, ඒ කියන්නේ වික්ටෝරියා ප්රාන්තය තුළ ආබාධිතයන් සඳහා ස්වේච්ඡාවෙන් වැඩ කරනවා. ස්වේච්ඡා සංවිධාන 4 ක විතර ඉන්නවා. ඒ හින්දා මම ඒ එහෙම, ඒ කියන්නේ ආබාධිතයන් වගේ, මම වගේ කට්ටියත් එක්ක ඉන්න හින්දා මට සාමාන්ය කෙනෙක්ට වඩා තියෙන ස්පෝට්ස් තියෙන්නේ මොනවද, ඒ කියන්නේ ආබාධිත අයට ඕස්ට්රේලියානු ආණ්ඩුවෙන් තියෙන සෑම දෙයක්ම මට ඒ අයගෙන් ආරංචි වෙනවා. ඒ අනුව මම හැම එකකටම ඉදිරිපත් වෙනවා. මම විශේෂයෙන්ම ඉදිරිපත් වීමක් කරලා තිබෙනවා. දෙපාරක් සිටි කවුන්සිල් එකට ඉදිරිපත් වෙලා තියෙනවා. ඊළඟට මම වික්ටෝරියානු ප්රාන්තය තුළ වීල් චෙයා බැට්මින්ටන් ක්රීඩාව කරනවා. ඒකෙන් මම 2018 ඕස්ට්රේලියාව ඇතුළේ තිබුණා වීල් චෙයා බැටමින්ටන් ගහන්න අයගේ අන්තර්ජාතික ක්රීඩා මාලාවක් තිබුණා. ඒකට මම ඕස්ට්රේලියාව වෙනුවෙන් තරඟ කිරීමට මට අවස්ථාවක් හම්බුණා. ඒ අතරේ මම වික්ටෝරියානු ප්රාන්තය තුළ කිහිප වතාවක්ම කේවල සහ යුගළ බැට්මින්ටන් ක්රීඩාවේ ජයග්රහණ කිහිපයක් අරගෙන තියෙනවා. ඒ අතර 2016 වික්ටෝරියානු ප්රාන්තයේ ආබාධිතයන් සඳහා දුන්නා මේ ස්වේච්ඡා සංවිධාන වලින් ස්වේච්ඡාවෙන් වැඩ කරන කණ්ඩායමට හම්බෙච්ච අවෝඩ් එකක් හම්බෙලා තියෙනවා මට. එච්චර තමා මට කියන්න තියෙන්නේ. | a wheelchair for over 20 years now. I have been volunteering for the disabled in Victoria, meaning the state of Victoria, for about 14 years now. I am in about 4 Non-Governmental Organisations. That's how I get to know about what sports are available for people with disabilities because I'm with people like me. That means I hear from them about everything the Australian government has for disabled people. Accordingly, I attend to each one. I have made a special presentation. I have represented myself in the city council twice. I also play wheelchair badminton in the state of Victoria. In 2018 there was an international series for wheelchair badminton players in Australia. It gave me an opportunity to compete for Australia. I have won several single and double titles in the Victorian state. Meanwhile, in 2016, I was awarded an award from this voluntary organization for disabled volunteers in the state of Victoria. That's all I have to say. |
| 00:04:49 | 00:05:14 | Charitha: හොඳයි! ඔබ බොහෝ දේ සාක්ෂාත් කරගෙන තිබෙනවා. | Charitha: Good! You have achieved a lot. You have put aside |

| | | | |
|---|---|---|---|
| | | ඔබේ තිබෙන ආබාධිත බව පැත්තකට දාලා ඔබේ අරමුණු වෙනුවෙන් ඔබ ගිහිල්ලා තිබෙනවා. ඔබ එය කිසි විටෙකත් බාධාවක් කරගෙන නැති බවයි අපිට පේන්නේ. ඔබේ අරමුණු සාක්ශාත් කර ගැනීමට හැකි උනේ කොහොමද? මේ වගේ මේ විශාල ජයග්‍රහණ ලබා ගන්නට ඔබට හැකි උනේ කොහොමද? | your disability and gone for your goals. We see that you have never made it a hindrance. How did you achieve your goals? How did you manage to achieve such great achievements? |
| 00:05:16 | 00:07:39 | Pradeep: ඒකට එකම රහස තමයි මගේ ඉදිරිපත් වීම. මගේ ආබාධිතත්වය ගැන එච්චර හිතන්න යන්නෑ. මම ඇත්තම කිව්වොත් මම ඊයේ වෙච්ච දේ ගැන ආයේ හිතන්නෑ. මම ඇත්තටම අද දවස සහ හෙට ගැන හිතන්නේ. ඒ අනුව මම කරන්නේ ඕස්ට්‍රේලියාව තුළ ආබාධිතයන්ට තියෙන හැම පහසුකමක්ම හැම ඒ කියන්නේ ක්‍රීඩා පහසුකම් ඊළඟට කෑම්පින් ඊළඟට හැම ස්නෝකලින් කරන එක, මුහුදේ පීනන්න යන එක හැම තියෙන අවස්ථාවකටම මං ඉදිරිපත් වෙනවා. ඒ අතරම මම දැනට ස්වේච්ඡාවෙන් අවුරුදු 14 ක් පමණ “ඉයර් සපෝට්” කියලා ඒකට කියන්නේ. ඒ කියන්නේ ආබාධිත මම වගේ සුසුම්නා ආබාධිත වෙච්ච කට්ටියට අපි ගිහිල්ලා උපදේශන තියනවා. ඒ වගේම එයාලව දිරිමත් කරනවා. ඒ වෙනුවෙන් මම ඒ අයට කියන්න ඉස්සෙල්ලා මම ඒ දේවල් කරලා තියෙන්න ඕන. ඒ හින්දා මම සාමන්‍යයෙන් හැම ඒ කියන්නේ ක්‍රීඩාවක්ම කරනවා. විශේෂයෙන්ම බැට්මින්ටන් ගහන එක, ඊළඟට කෑම්පින් යන එක, පිහිනුම් කරන එක, ඊළඟට ස්නෝකලින් කරන එක එන්න ඒ වගේ මම හැම සෑම ක්‍රීඩාවකටම, සෑම විනෝදාංශයක්ම කරනවා. විශේෂ එක හේතුවක් තමයි, ඒ | Pradeep: The only secret to that is my presence. I will not think so much about my disability. To be honest, I don't think about what happened yesterday. I only think about today and tomorrow. Accordingly, I engage in all the facilities available for disabled people in Australia, that is sports facilities, like camping, snorkeling and swimming in the sea. I represent myself at every opportunity. At the same time, I have been volunteering for about 14 years now at, it's called "ear support". That means we have to go and give advice to people who are disabled like me, and encourage them. For that, I should have done those things before I advised them. That's why I usually play all those sports. Especially playing badminton, camping, swimming, and snorkeling, I do all sports and hobbies like that. One particular reason is that I can tell the people I consult with, about what I have done. That's why I represent myself in everything and to go for my goals... |

| | | | |
|---|---|---|---|
| | | වගේ මම මේ උපදේශන කරන කට්ටියට මම කරපු දේ ගැන මං ඒ අයට කියන්න පුළුවන්. එන්න ඒක හින්දා තමයි මම එහෙම ඒ හින්දා මම හැමදේකටම ඉදිරිපත් වෙන හින්දා තමයි මට මගේ මේ අරමුණු වලට යෑමට.... | |
| 00:07:41 | 00:07:56 | Charitha: ඉදිරිපත් වීම පිළිබඳව ඔබ සඳහන් කළා. ඔබ පසුගිය කාලයේදී කවුන්සිල් මැතිවරණයට ඉදිරිපත් වීමට තීරණය කළා. ඔබ ඉදිරිපත් උනා. කවුන්සිල් මැතිවරණයට ඉදිරිපත් වෙන්න තීරණය කළේ ඇයි? | Charitha: You mentioned about representation. You recently decided to contest the council elections. You represented yourself. Why did you decide to run for the council elections? |
| 00:07:58 | 00:08:24 | Pradeep: ඇත්තටම ඒක කරේ, එකක් තමයි ආබාධිත අයට පෙන්නන්න ඕන මට අපි වගේ අයටත් මේ වගේ දේවල් කරන්න පුළුවන්. ඊළඟට ඊළඟ හේතුව තමයි ආබාධිත ප්රජාව වෙනුවෙන් මට සිටි කවුන්සිල් එක ඇතුළට ගිහිල්ලා එන්න ඒ වෙනුවෙන් හඬක් නඟන්න පුළුවන්. | Pradeep: I did it to show disabled people that people like me can do similar things, and the next reason is that I can go inside the council for the disabled community and raise a voice for it. |
| 00:08:25 | 00:08:42 | Charitha: මැතිවරණයකට ඉදිරිපත් වෙනවා කියන්නේ ලොකු ක්රියාවලියක්. කවුන්සිල් මැතිවරණ ක්රියාවලියට ඔබ ප් රවේශ උනේ කොහොමද, ඒ සඳහා අවස්ථාවක් හදා ගත්තේ කොහොමද, ඒ සඳහා දැනුවත් උනේ කොහොමද,... මේ පිළිබඳව අපිට පැහැදිලි කරන්න පුළුවන්ද? | Charith: Running for an election is a big process. How did you approach the council election process, how did you make an opportunity for it, how did you become aware of it... Can you explain this to us? |
| 00:08:43 | 00:09:45 | Pradeep: ඔව්. මේ රටේ ඕස්ට්රේලියානු සිටි කවුන්සිල් එකකට යන්න ස්වාධීනව අපිට ඉදිරිපත් වෙන්න පුළුවන්. සිටි කවුන්සිල් එකකට දේශපාලන පක්ෂෙකින් යන්න බැහැ. ඒ හින්දා අපි යන්න ඕන ස්වාධීනව. ඒ හින්දා මම හිතුවා මගේ යාළුවන්ගෙන් මෙන්න මේ වගේ දේකට යන්න පුළුවන් කියලා ඒ අය කියපු දේවල් මම අහගෙන හිටියා. ඊට පස්සේ මම ඒ ගැන ඉන්ටනෙර්ට් එකෙන් | Pradeep: We can run independently to go to an Australian city council in this country. We cannot go to a council election through a political party. That's why we have to go independently. That's why I thought that I could go to something like this, from my friends, and I was listening to what they said. Then I searched for it on the internet. How to |

| | | | |
|---|---|---|---|
| | | හොයලා බැලුවා. කොහොමද ඉදිරිපත් වෙන්නේ.... ඊට පස්සේ මංම ඇත්තටම ඕස්ට්‍රේලියාව තුළ දේශපාලන පක්ෂෙක ඉන්නවා.ඉතින් ඒක ඇතුළේ ඉන්නකොට මට ඒකේ අය කිව්වා මෙහෙම ඔයාට ඕන නම් ඉදිරිපත් වෙන්න පුළුවන් කියලා. ඒ හින්දා මම ඒ අයගෙන් අහගත්තා කොහොමද කරන්නේ, මැතිවරණයක් කරන විදිහ, එහෙම දේවල් වලට ඉදිරිපත් වෙන විදිහ ඒ අයගෙන් අහගෙන තමයි මම ඊට පස්සේ ස්වාධීනව ඉදිරිපත් උනේ. | represent myself.... and then I'm actually in a political party in Australia. So when I was there, the people told me that if I wanted, I could represent myself. That's why I asked them how to do it, how to conduct an election, and how to represent myself for such things, and after that, I came forward independently. |
| 00:09:47 | 00:10:08 | Charitha: රෝද පුටුවක සිටින ආබාධිත පුද්ගලයන්ට සමහර මහල් නිවාස වලට ඇතුළු වෙන්න අමාරුයි. එහෙම නැත්නම් ඒ සඳහා පහසුකම් නෑ. ඔබ ඔබගේ මැතිවරණ ව්‍යාපාරයේදී ඡන්ද දායකයින් හා සමීප වීමට මේ තත්ත්වය බාධාවක් උනාද? | Charitha: Some housing schemes make it difficult for disabled people in wheelchairs to enter. Or else there are no facilities for that. Did this situation prevent you from getting close to the voters during your election campaign? |
| 00:10:09 | 00:10:33 | Pradeep: අ.... එහෙම කිසිම බාධාවක් උන් නැහැ. එකම හේතුව තමයි ඕස්ට්‍රේලියාව තුළ තියෙන සෑම මහල් නිවාසයකටම අපි වගේ ආබාධිත අයට ඇතුළ් වෙන්න හැම පහසුකමක්ම තියෙනවා. එහෙම කිසිම මට.... අනිත් එක මම ඉන්න ප්‍රදේශය ඇතුළත එහෙම විශාල මහල් නිවාස නැහැ. | Pradeep: Oh... They have no such obstacles. The only reason is that every apartment in Australia has all the facilities for disabled people like us to enter. Nothing like that... The other is that there are no such big apartments in my area. |
| 00:10:35 | 00:10:50 | Charitha: ඊළඟ කාරණය තමයි දැන් ඔබ කවුන්සිල් මැතිවරණයට ඉදිරිපත් උන අපේක්ෂකයෙක්. ආබාධිත සහිත පුද්ගලයන් කවුන්සිල් එකක් නියෝජනය කිරීම වැදගත් කියලා ඔබ හිතන්නේ ඇයි? | Charitha: The next thing is that you are now a candidate for the council elections. Why do you think it is important for people with disabilities to be represented on a council? |
| 00:10:52 | 00:13:02 | Pradeep: මම හිතනවා... ඒ කියන්නේ ආබාධිත අයට තේරෙනවා ඒ තියෙන... එයාට අත් යාවශ්‍ය මොනවද කියලා. සාමාන් ය කෙනෙක් ඒක ගැන හිතලනේ හිතන්නේ. මෙන්න මෙහෙම විය | Pradeep: I think... That means disabled people understand that there are... what they need. A normal person thinks about it and thinks here's how it can happen. However, I can say it |

| | | | |
|---|---|---|---|
| | | හැකියි කියලා. ඒ උනාට මට ඒක ප්රායෝගිකව කියන්න පුළුවන් මොකද මම ඒක ප්රායෝගිකව එදිනෙදා ජීවිතයේ අත්විදින දෙයක්. ඒ හින්දා මට දෙයක් ගිහිල්ලා කියන්න පුළුවන්. ඒකට මම එක්තරා උදාහරණයක් ගත්තොත් දැන් පාරේ තියෙන මොකක් හරි ප්රශ්නයක් ඒ කියන්නේ පාර දිගේ මම, ඕස්ට්රේලියාවේ ෆුට් පාත් එකක් වගේ එකක මම වීල් චෙයාර් එකේ යද්දි එක තැනක මොකක් හරි ප්රශ්නයක් හරි ඒ කියන්නේ මොකක් හරි ප්රශ්නයක් තියෙනවනම් මට ඒක තේරෙනවා මොකද ඒ කියන්නේ ප්රායෝගිකව මම ඒ පාරේ යන ගමන් ඒකේ තියෙන මොකක් හරි දෙයක්, ඒක ගැන කියන්න පුළුවන් මට. මෙන්න මෙතන මෙන්න මේ විදිහට තිබුනොත් හොඳයි කියලා. අන්න ඒ වගේ දෙයක් මට සිටි කවුන්සිල් එක ඇතුළට ගියපුවහම ඉස්සරලා මේ තියෙන ප්රදේශය කියන්න පුළුවන්, අපි වගේ අයට කොයි වගේ පහසුකම් තියෙන්න ඕනෙද, තියෙන පහසුකම් කොයි ආකාරෙට තියෙන්න ඕනද කියලා ඒක මට ඒ කියන්නේ ප්රායෝගිකව පෙන්නලා දෙන්න පුළුවන්. ඊළඟට ඉස්සරහට කරන්න තියෙන දේවල් ඩිසේබිලිටි අයට මේ කියන පෙදෙසින් මෙන්න මේ මේ මේ දේවල්, ඒ කියන්නේ පාකර් එකක හරි, පිහිනුම් තටාකයක හරි, ඉස්සරහට හදන දෙයක් හරි හෝල් එකක හරි ඕනෙම දෙයක මොකක් හරි දෙයක්, ඉස්සරහට ප්ලෑන් කරන කොට මට පුළුවන් සිටි කවුන්සිල් එක ඇතුළට ගියොත් ඉස්සරහට කරන දෙයක් ගැන, ඒක ගැන කියලා දෙන්න හරි ඒ ගැන... | practically because I experience it practically in everyday life. That's why I can go and say something. As an example, if there is a problem on the road, that is, along the road like a footpath in Australia, when I am in a wheelchair, if I encounter a problem in one place, I understand it. This is because practically, when I walk down that road, I can tell about something that is there. Saying it would be better if it was like this. When I go to the council, I can tell about the area and what kind of facilities should be available for people like us and how those facilities should be. Therefore I can demonstrate it in practice. If I am able to go to the city council, I will be able to talk about things to be done, that can be done, in the area for people with disabilities, that is, in a park, in a swimming pool, in a building front, in a hall or anything like that, when planning ahead. I have practical experience about it. I think that's why I chose to go to the council in particular. |

| | | | |
|---|---|---|---|
| | | ඒ ගැන ප්රායෝගික අත්දැකීමක් තියෙනවා මට. මම හිතනවා ඒ හින්දා තමයි මම විශේෂයෙන්ම සිටි කවුන්සිල් එකට යන්න මම ඒක තිරණය කළේ. | |
| 00:13:03 | 00:13:18 | Charitha: තමන්ගේ ජීවිතයේ අරමුණු සාක්ශාත් කර ගැනීමට කැමති නමුත් ආබාධිතභාවය ඔවුන්ට බාධාවක් කියලා හිතන ආබාධිත සහිත පුද්ගලයන්ට ඔබ දෙන උපදෙස් මොනවද? | Charitha: What advice would you give to people with disabilities who want to achieve their goals in life but feel that their disability is holding them back? |
| 00:13:19 | 00:14:33 | Pradeep: අ... ආබාධිතත්වය ගැන හිතන්න යන්න එපා. මම දන්න විදිහට අපි ඔක්කොටම මොකක් හරි දෙයක් තියෙනවා. අර හැමෝමටම පේන්නැති ආබාධ තියෙනවා, ඒ කියන්නේ හුහක් අයට තියෙනවා පේන ආබාධ තියෙනවා. විශේෂයෙන් මං වැනි පුද්ගලයෙක්ගේ තියෙන ආබාධ තත්ත්වය හැමෝටම පේනවා මොකද මම ඉන්නේ වීල් වෙයාර් එකක. ඒ හින්දා මට කියන්න තියෙන්නේ... ඔක්කොටම මට කියන්න තියෙන්නේ, තමන්ගේ තියෙන ආබාධිතත්වය ගැන හිතන්න එපා. එකම දේ, තියෙන හැම මොහොතකම අබාධිතයන් සඳහා තියෙන හැම තියෙන පහසුකමක්ම භුක්ති විදින්න කියලා. එකම පාර ඒක. ඒ හින්දා අපි ඒ තියෙන පාරේ යා යුතුයි. ඒ කියන්නේ වෙච්ච දේ ගැන, ඇයි මට මෙහෙම උනේ කියලා හිතුවා කියලා ඒකෙන් අපිට කිසිම ප් රයෝජනයක් අත් වෙන්නෑ. අපි ඒකෙන් වෙන්නේ තව ඉස්සරහට යන එක තව තව අඩු වෙනවා. රෝගී වෙන එක. එකම දේ තමයි තියෙන හැම දේකටම ඉදිරිපත් වෙලා ජීවිතය සන්තෝසෙන් ඉන්න. | Pradeep: Oh... Don't think about the disability. As far as I know, there is something for all of us. Everyone has invisible disabilities, which means many people have visible disabilities. Everyone can see the disability of a person like me especially because I am in a wheelchair. All I have to say is, don't think about your disability. The only thing is to enjoy every available facility for the disabled at every moment. That's the only way. That's why we have to go that way. It means that it will not help us in any way if we think about what happened or why something like this happened to us. It makes us go further and further down. Getting sicker. The only thing is to be happy in life with everything you have. |
| 00:14:34 | 00:16:13 | Charitha: බොහොම ස්තූතියි ප් රදීප්. කවුන්සිල් මැතිවරණයක | Charitha: Thank you very much Pradeep. We consider running in |

| | | | |
|---|---|---|---|
| | | ඉදිරිපත් වීම ඉතාමත්ම අභියෝගාත්මක දෙයක් හැටියටයි අපි සලකන්නේ. නමුත් ආබාධිත පුද්ගලයෙකුට පවා ඒ සඳහා ඉදිරිපත් වීමට ඇති අවස්ථාව පිළිබඳව අපව දැනුවත් කිරීම පිළිබදව ඔබට අපි ස්තූතිවන්ත වෙනවා. නැවතත් අපට දැනුවත් කිරීමටත්, ඒ වගේම ඔබහේ අත්දැකීම් බෙදා හදා ගැනීමටත් අපත් සමඟ එකතු වූ ප්රදීප් හේවාවිතාරනටත් ඒ වගේම අපේ අසන්නන්ටත් බොහෝම ස්තූතියි. ඔබ මෙවන් තවත් සාකච්ඡා වලට සවන් දීමට කැමතිනම් speakmylanguage.com.au අපේ වෙබ් අඩවියට පිවිසෙන්න.කරුණාකර Speak My Language වැඩසටහන පිළිබඳව තවත් අය දැනුවත් කරන්න.ඕස්ට් රේලියාව පුරාත් ඉන් ඔබ්බට ගොස් ලෝකය පුරාත් මේ සංවාදය පතුරවා හැරීමට Facebook, Twitter, Instagram හෝ LinkedIn අප සමග සම්බන්ධ වෙන්න. වික්ටෝරියාවේ Speak My Language වැඩසටහන ඉදිරිපත් කරන්නේ Ethnic Communities Council of Victoria ආයතනයයි. Speak My language වැඩසටහනට මූල්යදායකත්වය Department of Social Services. මෙම වැඩසටහන ඕස්ට්රේලියාව පුරා බෙදා හරින්නේ Ethnic and Multicultural Communities’ Council සහ Multicultural Councils දායකත්වයෙනි. අපගේ ජාතික විකාශන සහකරුවෝ SBS සහ NEMBC. | a council election as a very challenging thing. But we thank you for making us aware of the opportunity even for a disabled person to apply for it. Thanks again to Pradeep Hewavitharana for sharing your experiences to inform us and our listeners for joining us. If you want to listen to more discussions like this, visit our website speakmylanguage.com.au. Please inform others about the Speak My Language program. Connect with us on Facebook, Twitter, Instagram or LinkedIn to spread this conversation across Australia and beyond to the world. The Speak My Language program in Victoria is offered by the Ethnic Communities Council of Victoria. Sponsorship of Speak My Language Program is by the Department of Social Services. This program is delivered across Australia with the support of Ethnic and Multicultural Communities' Councils and Multicultural Councils. Our national broadcasting partners are SBS and NEMBC. |